**සැ. යු.** - 2019.04.26 වැනි දින පළ වූ අංක 2121 දරන ගැසට් පත්‍රයේ II කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,122 - 2019 මැයි මස 03 වැනි සිකුරාදා - 2019.05.03**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| රජයේ නිවේදන ... ... ... | 868 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 868 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සැ. යු. -** ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් හෝ ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීම (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත 2019 මැයි මස 26 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 මැයි මස 24 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 මැයි මස 10 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

867 – B 081519 — 403 (2019/05)
A 1-

# රජයේ නිවේදන

## වට්ටාපලෙල කණ්ණකි අම්බාල් පොංගල් උත්සවය - 2019

ඉහත සඳහන් පොංගල් උත්සවය 2019 මැයි මස 20 වැනි දින පෙ. ව. 6.00ට ආරම්භ කර 2019 මැයි 21 වැනි දින පෙ. ව. 6.00ට අවසන් වන බව පොදු මහජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

01. මේ පිළිබඳ 1949 මැයි 27 වැනි දින අංක 9978 හා 1950 මැයි 26 දිනැති අංක 10105 දරන රජයේ වලංගු රෙගුලාසිවලට පොදු මහජනතාවගේ අවධානය යොමු කරවනු ලැබේ.

02. ප්‍රසිද්ධියට පත් කරන ලද මෙම නීති රෙගුලාසි උත්සවය පැවැත්වෙන කාල සීමාව තුළ බලපැවැත්වෙනු ඇත.

ආර්. කේදීස්වරන්,
දිස්ත්‍රික් ලේකම්/ දිසාපති,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
මුලතිව්.

2019 අප්‍රේල් මස 16 වැනි දින.

05-89

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (ලියාපදිංචි අංක පී. කිව්. 116) අධ්‍යක්ෂක මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය.

ණය ගිණුම් අංක : 2024160.

නිශාන්ත සුරංග දෙව්පුර.

2019 පෙබරවාරි මස 22 වැනි දින පැවැත්වූ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත සඳහන් පරිදි විශේෂිතව හා ඒකමතිකව සම්මත කරගන්නා ලදී.

කෑගල්ල ප්‍රසිද්ධ නොතාරිස් E. D. M. ජයවර්ධන විසින් සහතික කරන ලද 2016.07.01 වැනි දින අංක 13494 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. නමින් වූ බැඳුම්කරය යටතේ නිශාන්ත සුරංග දෙව්පුර යන අය බන්ධනදායි වශයෙන් එකී බැඳුම්කරය යටතේ රුපියල් හැට පන් ලක්ෂ නමදහස් හත්සිය හැත්තෑ එකයි ශත දහසයක් (රු. 6,509,771.16) මුදලක් 2019 ජනවාරි මස 18 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් එකී රුපියල් හැටපන් ලක්ෂ නමදහස් හත්සිය හැත්තෑ එකයි ශත දහසයක් (රු. 6,509,771.16) මුදලක් හා 2019 ජනවාරි මස 19 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රුපියල් 5,782,963.45ක මුදලක් සඳහා වාර්ෂිකව 14% බැගින් වූ පොළිය ද, ප්‍රචාරක වියදම් හා වෙනත් යම් ගෙවීමක් ඇතොත් ඒවා ද මේ වන විට කරනු ලැබූ (යම්) ගෙවීමක් ඇතොත් ඒවා ද අඩු කර අය කර ගැනීම සඳහා එකී අංක 13494 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වෙත උකස් කර ඇති මෙහි පහත උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කරන ලද දේපළ හා පරිශ්‍රය මහනුවර, මාවිල්මඩ, දුටුගැමුණු මාවත, අංක 369/1 හි බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ පැවරි ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මෙයින් සම්මත කර ගනී.

### ඉහත සඳහන් උපලේඛනය

සබරගමු පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, පරාකුරු කෝරළේ, මාවත පත්තු කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ කෑගල්ල සහා සීමාවන් තුළ රංවල ග්‍රාමනිලධාරී වසම, රංවල ගමේ, කොළඹ මහනුවර මාර්ගයේ පිහිටි කපුගේ ඔයබඩ පිල්ලෑව නමැති ඉඩමට බලයලත් මානක කේ. සිසිර පණ්ඩිතරත්න විසින් 2001.04.05 වැනි දින මැන සාදන ලද අංක 4450 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කළ ලොට් 02 නමැති ඉඩම් කොටසට මායිම්, එනම්, උතුරු - නැගෙනහිරට : ඔයෙන් ද, නැගෙනහිරට : ඇල සහ ගල් බැම්මෙන් ද, දකුණට : කොළඹ - මහනුවර

ප්‍රධාන පාරෙන්ද, බස්නාහිරට : පිඹුරු අංක 4450 නිරූපිත ලොට් 01 න්ද යන මෙකී මායිම් තුළ පිහිටි ගහකොළ, වගාව, ගොඩනැගිලි ඇතුළු අනෙකුත් සියලු දේ. ඉඩමේ ප්‍රාමාණය පර්චස් එකොළහයි දශම හතරයි තුනයි හතයි පහක් (අ.00, රූ.00, පර්. 11.4375) විශාල ඉඩම මෙය කෑගල්ල ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ වෙළුම/පත්ඉරුව ඩී 14/01 ලියාපදිංචි කර ඇත.

මෑතකදී කරන ලද මැනුමකට අනුව ඉහත ඉඩම පහත පරිදි විස්තර කර ඇත.

සබරගමු පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, පරාකුරු කෝරළේ, මාවත පත්තු කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ කෑගල්ල සභා සීමාවන් තුළ රංවල ග්‍රාම නිලධාරි වසම, රංවල ගමේ, කොළඹ මහනුවර මාර්ගයේ පිහිටි කපුගේ ඔයබඩ පිල්ලෑව නමැති ඉඩමට බලයලත් මානක J. R. M. B. ජයකොඩි විසින් 2016.02.27 වැනි දින මැන සාදන ලද අංක 16/629 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කළ ලොට් 01 නමැති ඉඩම් කොටසට මායිම්, එනම්, උතුරට : ඔයෙන් ද, නැගෙනහිරට : ඔය සහ ඇලෙන් ද, දකුණට : කොළඹ - මහනුවර ප්‍රධාන පාරෙන් ද, බස්නාහිරට : බලයලත් මානක කේ. සිසිර පණ්ඩිතරත්න විසින් 2001/04/05 වැනි දින මැන සාදන ලද පිඹුරු අංක 4550 නිරූපිත ලොට් 02 හි ඉතුරු කොටසින් ද යන මේකී මායිම් තුළ පිහිටි ගහකොළ, වගාව, ගොඩනැගිලි ඇතුළු අනෙකුත් සියලු දේ. ඉඩමේ ප්‍රමාණය පර්චස් දහයයි දශම හතයි අටක් (අ.00, රූ.00, පර්.10.78) විශාල ඉඩම.

රංජනී ගමගේ මිය,
සමාගම් ලේකම්.

05-26

---

**මහජන බැංකුව - බඩල්කුඹුර ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධනය කරන ලද 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29D වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධනය කරන ලද 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2019.03.12 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව තීරණය කළ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහජන බැංකුව වෙනුවෙන් ප්‍රසිද්ධ නොතාරිස් මංජුලා උක්වත්තගේ මහත්මිය විසින් ලියා සහතික කරන ලද 2017.03.16 දිනැති අංක 981, 983, 985 සහ 2017.07.18 දිනැති අංක 1105 දරන උකස්කර ප්‍රකාර ගෙවීම් කෝණාර මුදියන්සේලාගේ ප්‍රියන්ත ජයලාල් නොහොත් කෝණාර මුදියන්සේලාගේ ප්‍රියන්ත ජයලාල් කෝණාර යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද සහ එකී අංක 981 උකස්කරය යටතේ රුපියල් දහහත් ලක්ෂ හත්සිය හැත්තෑ හත් දහස් අටසිය අනූතුනයි ශත හතලිස් තුනක (රු. 1,777,893.43) මුදලක් සහ වර්ෂ 2018.08.17 වැනි දින සිට සියයට දහහතයි දශම පහක් (17.5%) බැගින් පොළියක් ද අංක 983 උකස්කරය යටතේ රුපියල් දහඅටලක්ෂ හතලිස් පන්දහස් අටසිය විස්සයි ශත තිහක (රු. 1,845,820.30) මුදලක් සහ වර්ෂ 2018.08.17 වැනි දින සිට සියයට දහ අටක් (18%) බැගින් පොළිය ද අංක 985 උකස්කරය යටතේ රුපියල් ලක්ෂ තිහක (රු. 3,000,000) මුදලක් සහ වර්ෂ 2018.08.17 වැනි දින සිට සියයට දහනවයයි දශම පහ (19.5%) බැගින් පොළියක් ද සහ අංක 1105 දරන උකස්කරය යටතේ රුපියල් ලක්ෂ තිහක (රු. 3,000,000) මුදලක් සහ වර්ෂ 2018.05.31 වැනි දින සිට සියයට දහඅටක් (18%) බැගින් පොළියක් ද මහජන බැංකුවට ගෙවීමට ඇති බැවින් ද, එකී ණය මුදල් හතර වන එනම්, රුපියල් දහහත් ලක්ෂ හත්සිය හැත්තෑ හත් දහස් අටසිය අනූතුනයි ශත හතලිස් තුනක (රු. 1,777,893.43) මුදලක් සහ වර්ෂ 2018.08.17 වැනි දින සිට සියයට දහහතයි දශම පහක් (17.5%) බැගින් පොළියක් ද රුපියල් දහඅටලක්ෂ හතලිස් පන්දහස් අටසිය විස්සයි ශත තිහක (රු. 1,845,820.30) මුදලක් සහ වර්ෂ 2018.08.17 වැනි දින සිට සියයට දහඅටක් (18%) බැගින් පොළියක් ද, රුපියල් ලක්ෂ තිහක (රු. 3,000,000) මුදලක් සහ වර්ෂ 2018.08.17 වැනි දින සිට සියයට දහනවයයි දශම පහක් (19.5%) බැගින් පොළියක් ද සහ රුපියල් ලක්ෂ තිහක (රු. 3,000,000) මුදලක් සහ වර්ෂ 2018.05.31 වැනි දින සිට සියයට දහඅටක් (18%) බැගින් පොළියක් ද,

වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය ද වෙන්දේසි ගාස්තුව ද වෙන්දේසි දිනය තෙක් යම් ගෙවීමක් කර ඇත්නම් ඒවාද අඩුකරගෙන අදාළ මුදල අයකර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකාර ඊ. එස්. රාමනායක මිය විසින් එකී අංක 981, 983, 985 සහ 1105 දරන උකස්කරයන් යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

**උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර**

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, මොණරාගල කොට්ඨාසයේ කියා තිබුණත් දැනට බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කඳුකර කෝරළයේ, වාසිපන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, අලුපොත ගම පිහිටි "කැන්දලන්දේ හේනේ වත්ත" නැමති ඉඩම් ඩී. එම්. විමල්තිලක මහතා විසින් වර්ෂ 2014.02.24 වැනි දින නැවත බෙදා මැන සාදා අඳින ලද 1974 දරන පිඹුර ප්‍රකාර අංක 03 දරන කැබැල්ලට මායිම්, උතුරට : එෆ්. වී. පී. 210 හි කැබලි අංක 69ඊ සහ මෙම පිඹුරේ කැබලි අංක 01 ද, නැගෙනහිරට : මෙම පිඹුරේ කැබලි අංක 01 සහ 02 ද, දකුණට : එෆ්. වී. පී. 210 හි කැබලි අංක 70 සහ මෙම පිඹුරේ කැබලි අංක 04 ද, බටහිරට : මෙම පිඹුරේ කැබලි අංක 04 සහ එෆ්. වී. පී. 210 හි කැබලි අංක $69^{E}$ කැබැල්ල ද යන මායිම් තුළ පිහිටි රූඩ් එකයි පර්චස් විසිඅටක (අක්.00, රූඩ්.01, පර්.28)

හෙවත් හෙක්ටයාර් බින්දුවයි දශම එකයි හතයි දෙකක් (හෙක්. 0.172) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි සියලු දේත් වේ.

මෙම ඉඩම මොණරාගල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B 19/81 අංක දරන පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂක මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රසාද් මාරසිංහ,
ප්‍රාදේශීය කළමනාකාර,
මොණරාගල.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 119, වැල්ලවාය පාර,
මොණරාගල.

05-50

---

## මහජන බැංකුව - මොණරාගල ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධනය කරන ලද 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29D වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධනය කරන ලද 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2019.03.12 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව තීරණය කළ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහජන බැංකුව වෙනුවෙන් ප්‍රසිද්ධ නොතාරිස් ජී. විජේතුංග මහතා විසින් ලියා සහතික කරන ලද 2018.02.02 දිනැති අංක 7447 සහ 2018.02.02 දිනැති අංක 7449 දරන උකස්කර සහ 2018.02.27 දිනැති අංක 7467 දරන උකස්කර ප්‍රකාර ගෙවීම් බාල ලියනගේ සුදත් පෙරේරා යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද සහ එකී අංක 7447 උකස්කරය යටතේ රුපියල් දස මිලියනයක (රු. 10,000,000) මුදලක් සහ වර්ෂ 2018.12.10 වැනි දින සිට සියයට විසි එකයි දශම පහ (21.5%) බැගින් පොළියක් ද අංක 7449 උකස්කරය යටතේ රුපියල් දොළොස් මිලියන නවලක්ෂ දහසය දහස් හයසිය හැට හයයි ශත හැත්තෑවක (රු. 12,916,666.70) මුදලක් සහ වර්ෂ 2018.11.23 වැනි දින සිට සියයට විස්ස (20%) බැගින් පොළිය ද අංක 7467 උකස්කරය යටතේ රුපියල් දහහත් මිලියන පන්ලක්ෂ විසිපන්දහස් දෙසිය දහ හතයි ශත අනූහය (රු. 17,525,217.96) මුදලක් සහ වර්ෂ 2018.09.12 වැනි දින සිට AWPLR + 2%+ 4ක් බැගින් පොළියක් ද මහජන බැංකුවට ගෙවීමට ඇති බැවින්, එකී ණය මුදල් තුන් වන එනම්, රුපියල් දස මිලියනයක (රු. 10,000,000) මුදලක් සහ වර්ෂ 2018.12.10 වැනි දින සිට සියයට විසි එකයි දශම පහ (21.5%) බැගින් පොළියක් ද, රුපියල් දොළොස් මිලියන නවලක්ෂ දහසය දහස් හයසිය හැට හයයි ශත හැත්තෑවක (රු. 12,916,666.70) මුදලක් සහ වර්ෂ 2018.11.23 වැනි දින සිට සියයට විස්සක් (20%) බැගින් පොළිය ද, රුපියල් දහහත් මිලියන පන්ලක්ෂ විසිපන්දහස් දෙසිය දහ හතයි ශත අනූහය (රු. 17,525,217.96) මුදලක් සහ වර්ෂ 2018.09.12 වැනි දින සිට AWPLR + 2%+ 4ක් බැගින් පොළියක් ද වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය ද වෙන්දේසි ගාස්තුව ද, වෙන්දේසි දිනය තෙක් යම් ගෙවීමක් කර ඇත්නම් ඒවාද අඩුකරගෙන අදාළ මුදල අයකර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකාරිය ඊ. එස්. රාමනායක මිය විසින් එකී අංක 7447, 7449 සහ 7467 දරන උකස්කරයන් යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

#### උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර

*උපලේඛනය*

01\. ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, මොණරාගල කොටසේ කියා තිබුණත් නිවැරදිව මොණරාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බුත්තල වැදිරට කෝරළයේ, මුප්පනේ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, මුප්පනේ නැමති ගමේ පිහිටා ඇත්තා වූද "කලුගහලන්ද" නැමති අක්කර දෙකයි රූඩ් තුනයි පර්චස් දහසයක් (අක්.02, රූඩ් 03, පර්.16) විශාලත්වය ඇති ඉඩමට මායිම්, උතුරට : ඇල ද, නැගෙනහිරට : ටී. පී. 202459 ද, දකුණට : පාර ද, බටහිරට : ටී. පී. 172 හි ලොට් 28 ද යන සතර මායිම් තුළ පිහිටි ඉඩමට, මොණරාගල දිසා අධිකරණයේ පී. 8023 දරන බෙදුම් නඩුවේ තීන්දුව මත මා හට අයිති ඉඩමෙන් බෙදා වෙන්කළ කොටසක් වන රූඩ් එකයි පර්චස් විසිහයයි දශම නවයයි බින්දුවක් (අක්.00, රූඩ් 01, පර්.26.90) විශාලත්වය ඇති කලුගහලන්ද නැමති ඉඩමේ කොටසකට බදුල්ල පදිංචි බලයලත් මිනින්දෝරු එම්. ෆුවාඩ් ස්මයිල් මහතා විසින් වර්ෂ 1996.06.16 වැනි දින මැන සාදන ලද අංක 4612 දරන පිඹුර ප්‍රකාර මායිම්, උතුරට : වික්‍රමසිංහගේ වත්ත ද, නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු එම්. ෆුවාඩ් ස්මයිල් මහතාගේ අංක 4299 සහ 1994.10.30 වැනි දින දරන පිඹුරේ කැබලි අංක 01 ද, දකුණට : මනානාම පාර ද, බටහිරට : බලයලත් මිනින්දෝරු එම්. ෆුවාඩ් ස්මයිල් මහතාගේ අංක 455 A සහ 1975.04.22 දින දරන පිඹුරේ කැබලි අංක 01 ද, යන සතර මායිම් තුළ පිහිටි ඉඩම ඇතුළු ඊට අයත් සෑම සියලු දේත් වේ. මෙම ඉඩම මොණරාගල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A 32/66 අංක දරන පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත.

02\. ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, මොණරාගල කොටසේ කියා තිබුණත් නිවැරදිව මොණරාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බුත්තල වැදිරට කෝරළයේ, මුප්පනේ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, මුප්පනේ නැමති ගමේ පිහිටා ඇත්තා වූද "කලුගහලන්ද" නම් වූ ඉඩමෙන් බෙදා වෙන්කර ගන්නා ලද කොටසකට මොණරාගල හිඳිකිවුල හි පදිංචි

බලයලත් මිනින්දෝරු එල්. කේ. ගුණසේකර මහතා විසින් වර්ෂ 1998.12.07 වැනි දින මැන සාදන ලද අංක 1785 දරන පිඹුරේ කැබලි අංක 09 වශයෙන් දක්වා ඇති පර්චස් දහයක් (අක්.00, රූඩ්.00, පර්.10) විශාලත්වය ඇති ඉඩම් කැබැල්ලට මායිම්, උතුරට : කඳුර ද, නැගෙනහිරට : අංක 3797 දරන පිඹුරේ කැබලි අංක බී ද, දකුණට : පාර ද, බටහිරට : කැබලි අංක 08 ද, යන සතර මායිම් තුළ පිහිටි ඉඩම සහ ඊට අයත් සෑම සියලු දේත් වේ. මෙම ඉඩම මොණරාගල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A 32/67 අංක දරන පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂක මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රසාද් මාරසිංහ,
ප්‍රාදේශීය කළමණාකාර,
මොණරාගල.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 119, වැල්ලවාය පාර,
මොණරාගල.

05-51

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

2019.03.07 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් කේ. ජේ. අශෝක ද සිල්වා විසින් සහතික කරන ලද 2014 ජුනි 24 දිනැති අංක 417 දරන උකස් බැඳුම්කරය ද ප්‍රසිද්ධ නොතාරිස් එන්. පී. ජී. චන්ද්‍රිකා විසින් සහතික කරන ලද 2015 අගෝස්තු 10 දිනැති අංක 3729 දරන උකස් බැඳුම්කරය ද 2015 අගෝස්තු 10 දිනැති අංක 3730 දරන උකස් බැඳුම්කර අනුව 2018.10.15 දින තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රුපියල් පනස් හතර ලක්ෂ දහහත්දහස් හත්සියයි ශත හතලිස් අටක (රු. 5,417,700.48) මුදල සමග ප්‍රතිලේඛනගත ණය A රුපියල් පනස්ලක්ෂ හතලිස්දහසක (රු. 5,040,000.00) මුදල මත වසරකට සියයට දොළහ (12%) බැගින් 2018.10.16 දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් තවදුරටත් පොළිය ද ප්‍රතිලේඛනගත ණය B මත රුපියල් හයලක්ෂ හත්සිය හැත්තෑ හතයි ශත හතලිස් පහක (රු. 600,777.45) මුදල සමග 2018.10.15 දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් තවදුරටත් පොළිය ද, කොස්ගොඩ, එගොඩදූව, පුංචමලකන්ද, බෝගහවාඩිය වත්ත, තොම්මාදුර ඉරේෂ් පාලිංග හංසරාජ් මෙන්ඩිස් මහතා වෙතින් අයවිය යුතුව ඇත.

2. ප්‍රසිද්ධ නොතාරිස් කේ. ජේ. අශෝක ද සිල්වා විසින් සහතික කරන ලද 2014 ජුනි 24 දිනැති අංක 417 දරන උකස් බැඳුම්කරය ද ප්‍රසිද්ධ නොතාරිස් එන්. පී. ජී. චන්ද්‍රිකා විසින් සහතික කරන ලද 2015 අගෝස්තු 10 දිනැති අංක 3729 දරන උකස් බැඳුම්කරය සහ 2015 අගෝස්තු 10 දිනැති අංක 3730 දරන උකස් බැඳුම්කරය අනුව රුපියල් පනස්හතර ලක්ෂ දහහත්දහස් හත්සියයි ශත හතලිස් අටක (රු. 5,417,700.48) මුදල සමග 2018.10.16 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළියද, ලංකා බැංකු ආඥා පනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල්ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව, විහාර මාවතේ, අංක 50/3 හි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා හට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වන වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ, අහුංගල්ල ශාඛාවේ කළමනාකරුහට මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

#### පළමු උපලේඛනය

1. දකුණු පළාතේ, ගාලු දිස්ත්‍රික්කයේ, බෙන්තොට වලල්ලාවිට කෝරළේ, බලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බලපිටිය ප්‍රාදේශීය සභා සීමාවේ, අංක 15 දරන දූවේමෝදර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කොසගොඩ, දූවේමෝදර පිහිටි "පුංචමලකන්ද" නැමති ඉඩමේ ලොට් X ලෙස දක්වා සීමා විස්තර කොට ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් X, උතුරට : T. P. 187249 හි ඉඩම ද, නැගෙනහිරට : අංක 2728 දරන පිඹුරෙහි ලොට් 3A2 ද, දකුණට : ලොට් Y (අංක 2728 දරන පිඹුරෙහි සලකුණු කිරීම) සහ බස්නාහිරට : එක ලොට් Y සහ පාර ද මායිම්ව බලයලත් මිනින්දෝරු එස්. පී. වීරවර්ධන විසින් සාදන ලද 2007 නොවැම්බර් 27 දිනැති අංක 2728 දරන පිඹුරෙහි නිරූපිත ආකාරයට අක්කර එකයි රූඩ් තුනයි පර්චස් දෙකක (අ.1, රූ.3, පර්.2) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති පස්, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ සහිත ය. මෙය බලපිටිය දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D 58/12හි ලියාපදිංචි කර ඇත.

2. එකී කොස්ගොඩ දූවේමෝදර පිහිටි "පුංචමලකන්ද" නැමති ඉඩමේ ලොට් 3A2 ලෙස දක්වා සීමා විස්තර කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 3A2, උතුරට : T. P. 187249 හි ඉඩම ද, නැගෙනහිරට : T. P. 155449 හි ඉඩම ද, දකුණට : එම ඉඩමේ ලොට් 3B ද, බස්නාහිරට : එම ඉඩමේ ලොට් 3A1 සහ ලොට් 3A3 (පාරට වෙන් කළ කොටස) ද මායිම්ව බලයලත් මිනින්දෝරු එස්. පී. වීරවර්ධන විසින් සාදන ලද 2007 නොවැම්බර් 27 දිනැති අංක 2728 දරන පිඹුරෙහි නිරූපිත ආකාරයට අක්කර එකයි රූඩ් එකයි පර්චස් දාහතයි දශම තුනක (අ.1, රූ.1, පර්. 17.3) බිම් ප්‍රමාණයකින් යුක්ත

වන අතර එහි ඇති පස්, ගහකොළ, වගාවන් සහ වෙනත් සියලු දේ සමග වේ. මෙය බලපිටිය දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D 58/26හි ලියාපදිංචි කර ඇත.

3. එකී කොස්ගොඩ දූවේමෝදර පිහිටි පුංචමලකන්දෙහි ලොට් Y ලෙස දක්වා බලයලත් මිනින්දෝරු එස්. පී. වීරවර්ධන විසින් සාදන ලද 2007.11.27 දිනැති අංක 2728 දරන පිඹුරෙහි නිරූපිත එකී ලොට් Y, උතුරට : එකී අංක 2728 දරන පිඹුරෙහි නිරූපිත ලොට් X ද, නැගෙනහිරට : එකී අංක 2728 දරන පිඹුරෙහි නිරූපිත ලොට් X ද, දකුණට : එකී අංක 2728 දරන පිඹුරෙහි නිරූපිත ලොට් 3A3 (පාරට වෙන් කළ කොටස) ද, බස්නාහිරට : පාර ද මායිම්ව පර්චස් විස්සක (අ.0, රූ.0, පර්.20) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ සමග වේ. මෙය බලපිටිය දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D/72/105 හි ලියාපදිංචි කර ඇත.

මෙම ඉඩම පහත විස්තර කර ඇති ඉඩම සමග සර්වසම වේ.

එකී කොස්ගොඩ දූවේමෝදර පිහිටි සහ බලයලත් මිනින්දෝරු එස්. පී. වීරවර්ධන විසින් සාදන ලද 2008 ජනවාරි 2 දිනැති අංක 2815 දරන පිඹුරෙහි නිරූපිත පුංචමාලකන්දහි ලොට් J ලෙස දක්වා ඇති ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් J උතුරට : එම ඉඩමේ ලොට් K ද, නැගෙනහිරට : එම ඉඩමේ ලොට් K ද, දකුණට : ලොට් 3A3 ද, බස්නාහිරට : පාර ද මායිම්ව පර්චස් විස්සක (අ.0, රූ.0, පර්.20) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති පස, ගහකොළ, වගාවන් සහ වෙනත් සියලු දේ ද වේ. මෙය බලපිටිය දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D72/105 හි ලියාපදිංචි කර ඇත.

මේ සමග මෙයට ලොට් 3 හි ලොට් 3A හි ලොට් 3A3 මතින් හා ඒ දිගට මාර්ග අයිතිය ද ඇත.

එකී දූවේමෝදර පිහිටි "පුංචමලකන්ද" නැමති ඉඩමේ ලොට් 3 හි ලොට් 3A හි ලොට් 3A3 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 3A3, උතුරට : එම ඉඩමේ ලොට් 3A1 ද, නැගෙනහිරට : එම ඉඩමේ ලොට් 3A2 ද, දකුණට : එම ඉඩමේ ලොට් 3B ද, බස්නාහිරට : ලොට් 2 (අඩි 16 පළල) මායිම් එකී අංක 2728 දරන පිඹුරෙහි නිරූපිත ආකාරයට පර්චස් දහඅටක (අ.0, රූ.0, පර්.18) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය බලපිටිය දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D58/13හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඒ. පී. ගඟබඩගේ මහත්මිය,
කළමනාකාරිණී.

ලංකා බැංකුව,
අහුංගල්ල.
2019 මාර්තු මස 29 වැනි දින.

05-65

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

2019.03.07 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් එන්. ටී. පතිනායක විසින් සහතික කරන ලද 2017.02.01 දිනැති අංක 3115 දරන උකස් බැඳුම්කරය අනුව 2018.10.29 දින තෙක් අයිරාව මත මුල් මුදල හා පොළිය වශයෙන් රුපියල් එක්කෝටි එකොළොස්ලක්ෂ තිස්එක්දහස් හත්සිය අසූවයි ශත අසූදෙකක (රු. 11,131,780.82) මුදල සමග රුපියල් කෝටියක (රු. 10,000,000.00) මුදල මත වසරකට සියයට දහහත (17%) බැගින් තවදුරටත් පොළියක් ද 2018.10.30 දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් පිටකොටුව, කෙලින් වීදිය, ප්‍රධාන නගර වෙළෙඳපොළ, අංක 251, 1/10 හි පරමනාතර් සිවසුබ්‍රමනියම් මහතා වෙතින් අයවිය යුතුව ඇත.

2. 2017.02.01 දිනැති අංක 3115 දරන උකස් බැඳුම්කරය අනුව අයවිය යුතු රුපියල් එක්කෝටි එකොළොස් ලක්ෂ තිස්එක්දහස් හත්සිය අසූවයි ශත අසූදෙකක (රු. 11,131,780.82) මුදල සමග 2018.10.30 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළියද, ලංකා බැංකු ආඥා පනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල්ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව, විහාර මාවතේ, අංක 50/3 හි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා හට එකී ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේද, ලංකා බැංකු ආඥා පනතේ 21 වන වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ, මධ්‍යම සුපිරි වෙළඳසැල ශාඛාවේ කළමනාකරුහට මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

උතුරු පළාතේ, කිලිනොච්චි දිස්ත්‍රික්කයේ, කරච්චි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කිලිනොච්චි කරච්චි ප්‍රාදේශීය සභා සීමාවේ, කිලිනොච්චි නගරය, අංක KN/23 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කිලිනොච්චියෙහි පිහිටි "කිලිනොච්චිකාඩු" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. කන්දසාමි විසින් සාදන ලද 2016 දෙසැම්බර් 19 දිනැති අංක 2016/4/270 පිඹුරට අනුව ලොට් 1 ලෙස දක්වා නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 1, උතුරට : අංක 224 දරන පිඹුරෙහි ලොට් 3 ද, නැගෙනහිරට : පාර ද, දකුණට : ලොට් 5 ද, බස්නාහිරට : මහනුවර සිට යාපනය දක්වා පාර ද මායිම්ව

එකී අංක 2016/4/270 දරන පිඹුරට අනුව කුලී හයයි දශම හතරයි තුනක (OLMS V. C. 6.43 Kls) හෙවත් හෙක්ටයාර 0.092ක හෙවත් වර්ග මීටර් 91.85ක බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති පස, ගහකොළ, ගොඩනැගිලි, වගාවන් හා වෙනත් සියලු දේ සමග වේ.

එකී ලොට් 1 පහත විස්තර කර ඇති ඉඩමෙහි නැවත මැනීමකි.

එකී කිලිනොච්චියෙහි පිහිටි "කිලිනොච්චිකාඩු" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. මහේන්තිරන් විසින් සාදන ලද 1982 දෙසැම්බර් 28 දිනැති අංක 224 දරන පිඹුරෙහි ලොට් 4 ලෙස දක්වා නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 4, උතුරට : අංක 224 දරන පිඹුරෙහි ලොට් 3 ද, නැගෙනහිරට : ලොට් 1 හි ළිඳ දක්වා දිවෙන අඩි 5 පාර ද, දකුණට : අංක 224 දරන පිඹුරෙහි ලොට් 5 ද, බස්නාහිරට : මහනුවර සිට යාපනය දක්වා පාර ද මායිම්ව එකී අංක 224 දරන පිඹුරට අනුව කුලී හතක (OLMS V. C. 7 Kls) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති පස, ගහකොළ, ගොඩනැගිලි, වගාවන් සහ වෙනත් සියලු දේ සමග වේ. මෙය කිලිනොච්චි ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M35/175 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. ශ්‍රී. බාලේෂ්වරන් මිය,
කළමනාකාරිණි.

ලංකා බැංකුව,
මධ්‍යම සුපිරි වෙළෙඳසැල ශාඛාව.

05-66

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

2019.03.07 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් ඩී. වීරසූරිය විසින් සහතික කරන ලද 2016.07.14 දිනැති අංක 4537 දරන උකස් බැඳුම්කරය අනුව 2018.09.17 දින තෙක් අයිරාව මත මුල් මුදල හා පොළිය වශයෙන් රුපියල් පනස් එක් ලක්ෂ අසූතුන්දහස් නවසිය හැත්තෑ දෙකයි ශත හැටක (රු. 5,183,972.60) මුදල සමග රුපියල් ලක්ෂ පනහක (රු. 5,000,000.00) මුදල මත වසරකට සියයට දහහත (17%) බැගින් 2018.09.18 දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් තවදුරටත් පොළියක් ද 2017.09.17 දින තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් ණය මත අයවිය යුතු රුපියල් පන්ලක්ෂ පනස්එක්දහස් නවසිය හතලිස් හයයි ශත දහහතරක (රු. 551,946.14) මුදල සමග රුපියල් පන්ලක්ෂ දසදහස් පන්සිය අනූහතරයි ශත විසිඑකක (රු. 510,594.21) මුදල මත වසරකට සියයට පහළොව (15%) බැගින් 2018.09.18 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් තවදුරටත් පොළියක් ද, පොල්ගස්ඕවිට, කිතුල්හේන, සම්බුද්ධි වත්ත, අංක 1D හි තේනුවරගේ ලක්ෂ්මන් අමරසේකර මහතා වෙතින් අයවිය යුතුව ඇත.

2. 2016.07.14 දිනැති අංක 4537 දරන උකස් බැඳුම්කරය මත අයිරාව මත අයවිය යුතු රුපියල් පනස්එක්ලක්ෂ අසූතුන්දහස් නවසිය හැත්තෑදෙකයි ශත හැටක (රු. 5,183,972.60) මුදල සහ ණය මත අයවිය යුතු රුපියල් පන්ලක්ෂ පනස්එක්දහස් නවසිය හතලිස්හයයි ශත දහහතරක (රු. 551,946.14) මුදල සමග 2018.09.18 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළියද, ලංකා බැංකු ආඥා පනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල්ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව, විහාර මාවතේ, අංක 50/3 හි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා හට එකී ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේද, ලංකා බැංකු ආඥා පනතේ 21 වන වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ, බොරැල්ල දෙවන ශාඛාවේ ශාඛා කළමනාකරුහට මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාබුල්ගොඩ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පිහිටි ඉඩමට සර්වේයර් ජනරාල් විසින් සහතික කරන ලද අංක 520016 දරන මහමාන සිතියමෙහි කලාප අංක 3 හි ලොට් 0151 ලෙස දක්වා සීමා විස්තර කොට ඇති බෙදූ ඉඩම් කැබැල්ල හෙක්ටයාර බිංදුවයි දශම බිංදුවයි තුනයි බිංදුවයි හතරක (හෙක්. 0.0304) බිම් ප්‍රමාණයකින් යුක්ත වේ. (මෙය අංක 00030054686 දරන හිමිකම් සහතිකය යටතේ ලියාපදිංචි කර ඇත.)

මේ සමග මෙයට එකී අංක 520016 දරන මහමාන සිතියමෙහි නිරූපණය කර ඇති ලොට් 41 මතින් මාර්ග අයිතිය ද ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එම්. එන්. කලුතන්ත්‍රී,
කළමනාකාරිණි.

ලංකා බැංකුව,
බොරැල්ල 2 වන ශාඛාව.

05-67

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2014 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

***සියලුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.***

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | **පිටපතක මිල** | **තැපැල් ගාස්තුව** |
|---|---|---|
| I වැනි කොටස : | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

*** කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනිපිටපත් මිල දී ගත හැක.**

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති *උපලේඛනයේ* දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන්ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2019** | | | |
| **මැයි** | 2019.05.03 | සිකුරාදා | 2019.04.18 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2019.05.10 | සිකුරාදා | 2019.04.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.05.17 | සිකුරාදා | 2019.05.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.05.24 | සිකුරාදා | 2019.05.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.05.31 | සිකුරාදා | 2019.05.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| **ජුනි** | 2019.06.07 | සිකුරාදා | 2019.05.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.06.14 | සිකුරාදා | 2019.05.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.06.21 | සිකුරාදා | 2019.06.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.06.28 | සිකුරාදා | 2019.06.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| **ජූලි** | 2019.07.05 | සිකුරාදා | 2019.06.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.07.12 | සිකුරාදා | 2019.06.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.07.19 | සිකුරාදා | 2019.07.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.07.26 | සිකුරාදා | 2019.07.12 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ - 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.